**ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගම - 2019/ 2020**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්  කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ 2020 මාර්තු 31 දිනට එකතුව රු.66,111,152 ක් වූ ලැබිය යුතු ශේෂ තුල වර්ෂ 5 ඉක්මවූ රු.15,297,192 ක් පැවතියද ප්‍රමිතයෙහි 11.21 ප්‍රකාරව හානිකරණ අලාභ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. ප්‍රමිතය ප්‍රකාරව ඉදිරි වර්ෂයේ සිට හානිකරණ අලාභ හඳුනාගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතයේ නියමයන් අනුව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කන්තලේ සූරියපුර ප්‍රදේශයේ වැලි කැණීම්වලින් ලද ආදායමෙන් මහවැලි ගඟේ ආරක්ෂණ වේලි 3 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කළ රු.30,497,926 ක් හා ඊට අදාලව දැරූ වියදම් රු.31,433,216 ක් ගිණුම්ගත කර නොතිබූ අතර රු.935,289 ක් වූ වැඩිපුර ගෙවීම පමණක් ගිණුම්වල දක්වා තිබුණි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2.52 ප්‍රකාරව වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් අදාල වැඩිපුර ගෙවීම වෙළඳ | මහවැලි ගඟේ ආරක්ෂන වේලි ඉදිකිරීම ව්‍යාපෘතිය ආරම්භයේදී ඇතිකරගත් මූලික ඒකඟතාවයක් මත සෑම වැලි කියුබ් එකකින් මුදලක් පුනරුත්ථාපන කටයුතු සඳහා වෙනම ගිණුමකට බැර කර අදාල ගෙවීම් උක්ත ගිණුමට හර කර ඇත. අනෙකුත් ව්‍යාපෘති වල ගිණුම්වලට සමානව මෙම ගිණුමද පවත්වාගෙන යනු ලබයි. | සියලු ගණුදෙනු නිවැරදි ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවිය යුතු අගයට හිලව් කර දැක්වීම හේතුවෙන් වගකීම් හා වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) 2019/2020 වසරේ අවසන් කාර්තුවේ ආදායම් බදු බැරකම් ගණනය කිරීමේදී සියයට 28 ක බදු අනුපාතය වෙනුවට සියයට 24 ක බදු අනුපාතය යොදා ගැනීම හේතුවෙන් ආදායම් බදු වියදම හා බදු වගකීම රු.674,397 ක් අඩුවෙන් දක්වා තිබුණි. මේ හේතුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම් ප්‍රමිත 29.27 ප්‍රකාර විලම්බිත බදු වත්කම් හා විලම්බිත බදු වගකීම් ගණනය කිරීමේදී විලම්බිත බදු වත්කම රු.824,512 කින් හා විලම්බිත බදු වගකීම රු.47,358 කින් අඩුවෙන් දක්වා තිබූ අතර විලම්බිත බදු ආදායමද රු.777,154 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සියලු ගණනය කිරීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තහවුරු කර ගැනීමෙන් පසු ආදායම් බදු පිලිබඳ දැනුම සහිත පාර්ශව සහ බදු උපදේශන සේවා අංශ වෙතින් ලබාගත් උපදෙස් මත සිදු කර ඇත. | නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |
| (ඇ) 2010 හා 2011 වර්ෂවලට අදාළ ව්‍යාපෘති දෙකක් සඳහා වැඩිපුර ඉන්වොයිස් කර තිබූ රු.2,049,600 ක් නිරවුල් කර නොතිබීම හේතුවෙන් ලැබිය යුතු ශේෂය හා ආදායම එම වටිනාකමෙන් වැඩිපුර දක්වා තිබුණි. | වැඩිපුර ඉන්වොයිස් කරන ලද මුදල ඉදිරි වර්ෂයේදී පොත්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශේෂ සනාථ කිරීම් වලදී මුලා ප්‍රකාශනවල දක්වා තිබූ රු.2,849,250 ක් වූ **ලැබිය යුතු** ශේෂ 2 ක් අදාල ආයතන විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. | ප්‍රතික්ෂේප කරන ලද ශේෂයන් ගිණුම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සියලු ණයගැති ශේෂ සනාථ කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව අවස්ථා 10 කදී ව්‍යාපෘති කාර්යයන් සඳහා රු.100,000 ඉක්මවා රු.5,124,500 ක අත්තිකාරම් නිකුත් කර තිබුණි. ලබා දී තිබූ රු.2,925,124 ක් වූ අතුරු අග්‍රිම ශේෂ 27 ක් සහ රු.466,096 ක් වූ සුළු මුදල් අග්‍රිම ශේෂ 24 ක් වර්ෂය අවසාන වන විටද පියවා නොතිබූ අතර අවස්ථා 17 කදී ලබාදී තිබූ රු.2,982,000 ක් වූ අත්තිකාරම් දින 115 ක් දක්වා ප්‍රමාද කර පියවා තිබුණි. | විධායක නිලධාරී සහ විෂයභාර කළමණාකරුගේ අනුමැතිය මත ව්‍යාපෘතිවල ස්වභාවය හා අවශ්‍යතාවය අනුව අත්තිකාරම් ලබා දී තිබේ. ලබාදෙන අත්තිකාරම් පියවීම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂය අවසන් දිනට පෙර සිදුකිරීමට වගබලා ගනු ලැබේ. | අදාල අනුමැතිය ලබාගැනීමට සහ මුදල් වර්ෂයේ අවසන් දිනට පෙර අත්තිකාරම් පියවා ගැනීමට පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය | සමාගම සඳහා 2019 මාර්තු 31 සිට අභ්‍යන්තර විගණකයෙකු නොවූ අතර සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් ද නොවීය. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩුව පිරවීමට කටයුතු කර විගණන සැලැස්මක් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ නියමයන්ට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 4.2.2 සහ 4.2.6 ඡේද | සමාගම විසින් කාර්තුමය, අර්ධවාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කාර්යසාධන වාර්තා පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) 5.2.3 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | 2019 ගිණුම් වර්ෂය දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට 2019 වර්ෂය සඳහා අයවැය ලේඛණයක් පිළියෙල කර තිබූ හෙයින් 2020 ජනවාරි සිට මාර්තු දක්වාද අයවැය ලේඛණයක් පිළියෙල කරන ලදී. | -එම - |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුනේ 2020 ජුලි 16 දිනදීය. | Covid 19 වසංගතය හේතුවෙන් අවසාන ගිණුම් පිළියෙල කිරීම ප්‍රමාද විය. ඉදිරියේදී ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුල ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම - |
| | (iv) 6.5.3 ඡේදය | 2015/2016, සිට 2018/2019 දක්වා වර්ෂවල වාර්ෂික වාර්තා 2020 අගෝස්තු 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2015/16 සිට 2018/19 දක්වා වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා මේ වන විට පිළියෙල කර රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | -එම - |
| | (v) 8.3.3 ඡේදය | ගෙවිය යුතු දිරි/ප්‍රසාද දීමනාවේ උපරිමය මාස 2 ක වැටුප වුවද මාස 3 ක දළ වැටුප පදනම් කරගෙන 2018/2019 වර්ෂයේ දිරි දීමනා ලෙස රු.9,211,983 ක් සේවකයන්ට ගෙවා තිබුණි. අදාල දිරිදීමනාව 2018/2019 වර්ෂය සඳහා වු විගණන වාර්තාව නිකුත් කිරීමටද පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. | 2019 සැප්තැම්බර් 11 දින ගෙවා ඇත්තේ ප්‍රසාද දීමනාවක් නොව දිරි දීමනාවකි. 2019 විගණන වාර්තාව නිකුත් කරන විට 2018/2019 වර්ෂයේ බදුපෙර ලාභය පදනම් කරගෙන දිරිදීමනා ගෙවීමට අධ්‍යක්ෂ මන්ඩල අනුමැතිය ලබාදී තිබුණ ද ගෙවීම් සිදුකරන ලද්දේ ඊට පසුවය. | -එම - |
| (ඇ) | 2015 ජූනි 17 දිනැති අංක PED 03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2 ඡේදය | රේඛීය අමාත්‍යවරයාගේ එකඟතාවය හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන සභාපති දීමනා ලෙස මසකට රු.50,000 බැගින් රු.550,000 ක් හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීත්ව දීමනා වශයෙන් අධ්‍යක්ෂවරුන් 8 කට එකතුව රු.257,000 ක් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව සභාපති දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩල සහභාගීත්ව දීමනා ගෙවා ඇත. චක්‍රලේඛය ප්‍රකාරව දීමනා ගෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | -එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 09 දිනැති අංක PED/03/2019 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5 ඡේදය | ප්‍රසාද දීමනා සඳහා සුදුසුකම් ලැබීමට සපුරා තිබිය යුතු අවශ්‍යතා සපුරා නොතිබිය දී 2018/2019 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ලෙස රු.2,027,339 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද රහිතව සේවකයන් 161 කට ගෙවා තිබුණි. | 2019 දෙසැම්බර් 09 දිනැති අංක PED/03/2019 දරන චක්‍රලේඛය මත පදනම්ව 2019/2020 වර්ෂයේදී ඒක් සේවකයෙකුට රු.13,500 බැගින් වූ ප්‍රසාද දීමනාවක් ප්‍රධාන විධායක නිළධාරීගේ අනුමැතිය ප්‍රකාරව ගෙවා ඇත. | -එම - |
| (ඉ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව 2021 සිට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ඇත. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.37,887,098 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.37,806,854 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.80,224 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. ව්‍යාපෘති ආදායම් රු.11,066,984 කින් හා අනෙකුත් මෙහෙයුම් නොවන ආදායම් රු.14,169,455 කින් වැඩිවී තිබුණද, ව්‍යාපෘති වියදම් රු.6,295,207 කින් අඩුවී පරිපාලන වියදම් රු.30,249,060 කින් හා මූල්‍ය වියදම් රු.987,843 කින් වැඩිවීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි සැලකිය යුතු වර්ධනයක් සිදුව නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කන්තලේ සූරියපුර තුම්මෝදර ප්‍රදේශයේ වැලි කැණීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ සමාගම අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව 2020 ජනවාරි වන විට වැලි කියුබ් 103,128 ක් කැණීම් කලයුතු වුවද 2020 අගෝස්තු 19 වන විට වැලි කියුබ් 41,297 ක් පමණක් කැණීම් කර තිබුණි. වැලි කැණීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ ගිවිසුම් ගත වීමේදී අදාල පිරිවැය කෙරෙහි සැලකිලිමත් නොවී බැංකු ඇපකරයක් ලබාදීමට එකඟවීම හේතුවෙන් ගෙවීමට සිදුවූ රු.900,000 ක කොමිස් මුදල සමාගමට අනාර්ථික වැය බරක් වී තිබුණි. | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විවිධ පාර්ශව විසින් විරෝධතා මතු කිරීම සහ වර්ෂාව හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රමාද වූ අතර සාර්ථකව සිදු කිරීමටද නොහැකි විය. මහවැලි අධිකාරිය ගිවිසුම තාවකාලිකව නතර කිරීම හේතුවෙන් ව්‍යාපෘති කාලය හා බැංකු ඇපකරය දීර්ඝ කර ගැනීමට සිදු විය. | ව්‍යාපෘති කාර්යක්ෂමව මෙහෙයවීමට හා ගිවිසුම් ගත වීමේදී අදාල පිරිවැය කෙරෙහි සැලකිලිමත් වීමට කටයුතු කල යුතුයි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2019 නොවැම්බර් 19 දින මනම්පිටිය ව්‍යාපෘති කාර්යාලයේ සිදුව තිබූ ගිනි ගැනීමක් හේතුවෙන් කාර්යාල බහාලුම් 03 ක තිබූ ලිපි ලේඛන හා රු.771,375 ක් වටිනා වත්කම් විනාශ වී තිබුණි. එම අවස්ථාවේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ආරක්ෂාවට යොදවා තිබූ අතර සවිකර තිබූ CCTV කැමරා පද්ධතිය අක්‍රීයව පැවතීමද මතභේදයට තුඩුදී තිබුණි. මෙය හිතාමතා සිදුකර ඇති ගිනි තැබීමක් බවට පොලිස් වාර්තාවේ සඳහන්ව තිබුණද මේ සම්බන්ධව සමාගම විසින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර නොතිබූ අතර හානි වූ වත්කම් සඳහා රක්ෂණ වන්දි ලබාගෙනද නොතිබුණි. | ගිනි ගැනීම සිදු වන විට සේවය කල ආරක්ෂක නිලධාරීන් පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර අක්‍රියව පැවති CCTV කැමරා පද්ධතිය අදාල සමාගම විසින් යථා තත්ත්වයට පත්කර දීමට පෙර මෙම සිදුවීම සිදු විය. මෙය හිතාමතා කල ක්‍රියාවක් බව පෙනී ගිය බැවින් අපක්ෂපාතී පරීක්ෂණයක් සඳහා විමර්ෂණ කටයුතු පොලීසිය වෙත භාරදීම නිසා අභ්‍යන්තර පරීක්ෂණයක් නොකරන ලදි. හානි වූ වත්කම් සඳහා රක්ෂණ වන්දි ලබා ගැනීමට අවශ්‍ය ලේඛන භාරදී ඇත. | අභ්‍යන්තර පරීක්ෂණයක් මගින් වරදකරුවන් හඳුනාගැනීමට හා රක්ෂණ වන්දි ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2008 මාර්තු 31 දිනැති අංක SC(F/R) no 81/04 දරන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති වන ගංවතුර තත්ත්වය පාලනය කර ගැනීම සඳහා මහවැලි ගඟේ මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැණීම් සිදුකිරීමට හා කොළඹ හා අනෙකුත් ප්‍රදේශවල වැලි හිඟයට පිළියම් ලෙස වැලි අලෙවිකිරීමට අවශ්‍ය පියවර ගැනීමට සමාගම වෙත අධිකාරිය පවරා තිබුණි. එසේ වුවද ව්‍යාපෘතියේ අදියර II මඟින් ගඟ පහළ ප්‍රදේශයේ වැලි කැණීම සඳහා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර නොමැති වීම හා අනෙකුත් අවසර කල් ඉකුත් වීම හේතුවෙන් 2019 නොවැම්බර් මාසයෙන් පසු වැලි කැණීම අතහැර දමා තිබූ අතර ප්‍රදේශයේ තවදුරටත් වැලි තැන්පත් වී තිබීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය අපේක්ෂා කළ පරිදි ගංවතුර පාලනය කිරීම අභියෝගකාරී වී තිබුණි. තවද, සමාගම විසින් වැලි නිකුත් කිරීමට සාධාරණ හා නිශ්චිත ක්‍රමවේදයක් | 2020 ජනවාරි 06 සිට පොළොන්නරු දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ලොරි රථවලට සියයට 75 ක් වෙන්කර තිබුණි. වැලි නිකුත් කිරීමේදි කිසිදු අවස්ථාවක ගමනාන්ත සීමා කිරීමක් නොකල අතර ව්‍යාපෘති වැලි බොහොමයක් කොළඹ හා අනෙකුත් දිස්ත්‍රික්ක වෙත යොමු වී තිබුණි. ඒනිසා ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මගින් අපේක්ෂිත අරමුණු ඉටු නොවීමක් සිදු වී නැත. | ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුන්වාදීමට කටයුතු කර නොතිබූ අතර ව්‍යාපෘතියෙන් කැණීම් කරනු ලබන වැලි වලින් සියයට 85 ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලොරි රථ සඳහා සහ සියයට 15 ක් දිස්ත්‍රික්කයෙන් පිටත ලොරි රථ සඳහා නිකුත් කර තිබීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් අපේක්ෂා කරන ලද පරිදි කොළඹ ඇතුළු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පවතින වැලි හිඟයට ව්‍යාපෘතිය මඟින් විසඳුමක් ලබාදීමට සමාගම කටයුතු කළේද යන්න සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත් විය නොහැක. | | |
| (ආ) | මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතියේ අදියර II හි 2018 ඔක්තෝබර් 16 දිනෙන් පසු වැලි කැණීම් සිදු කිරීමට වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අවසර ලබා දී නොතිබිය දී 2019 අගෝස්තු සිට නොවැම්බර් දක්වා කාලය තුල වැලි කියුබ් 3,120.5 ක් කැණීම් කර තිබුණි. | අදාල ආයතන වල අනුමැතිය ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත් කැණීම් බලපත්‍ර ලබා දී ඇති කාල සීමාවෙන් පිට කැණීම් කර නොමැත. | අදාල අනුමැතින් මත පමණක් කැනීම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි ව්‍යාපෘතිවල සේවය කරන වැලි කැණීම්කරුවන් හරිත වැලි තොටුපල සංකල්පයට අනුගත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ආවරණ අනුමැතිය මත රු.2,893,340 ක් වැයකර 2020 ජුනි 22 දින වැඩමුළුවක් පවත්වා තිබුණි. මේ සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන් වෙනුවට පුද්ගලික ආයතනයක් සම්බන්ධ කරගෙන රු.235,000 ක් ගෙවා තිබුණි. වැලි කැණීම්කරුන් 1500කට බෙදා දීම සඳහා රු.1,049,000 ක් වැයකර සකස් කල වියලි ආහාර ද්‍රව්‍ය මළු 1500 කින් 934 ක් එදින වැලි කැණීම්කරුවන්ට බෙදාදී තිබූ අතර රු.396,000 ක් වූ ඉතිරි වියලි ආහාර ද්‍රව්‍ය මළු 566 බෙදා හැරීමට අදාළ තොරතුරු අනාවරණය නොවුණි. සමාගමේ වැලි ව්‍යාපෘති බොහොමයක මංකඩවල හරිත වැලි තොටුපල සංකල්පය නිසි ලෙස ක්‍රියාත්මක වී නොතිබූ අතර වැඩමුළුවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී ද නොතිබුණි. | අදාල වැඩමුළුව කඩිනමින් පැවැත්වීමට සිදුවීම නිසා අනුමැතිය වැඩමුළුව පැවැත්වීමෙන් පසුව ලබා ගන්නා ලදි. අදාල දේශන සහ වැඩසටහන් සංවිධානය Colombo School of Business Management වෙත පවරන ලද්දේ එම ආයතනය එවැනි වැඩසටහන් සංවිධානය කිරීමේ ප්‍රමුඛයෙකු වන බැවිනි. මින් ඉදිරියේදී පිරිවැය අවම කරගනිමින් පවතින නීතිරීති සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. | අදාල අනුමැතිය මත පමණක් වැඩමුළු සංවිධානය කල යුතු අතර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත කොට්කම්බොක්ක තිරුවානා නිධියෙන් තිරුවානා කැණීම් කර අගය එකතු කර අපනයනය කිරීමට 2017 වර්ෂයේ සමාගමට පවරා තිබුණද 2020 අගෝස්තු දක්වා ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබූ අතර ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් ඇගයීමක් (EIA) වෙනුවට මූලික පාරිසරික පරීක්ෂණයක්(IEE) සිදුකිරීම ප්‍රමාණවත්ද යන්න පිළිබඳ නිශ්චිත තීරණයකට එළඹීමට අපොහොසත්ව තිබුණි. 2017 වර්ෂයේ සිට ව්‍යාපෘතියෙන් කිසිදු ආදායමක් උපයා නොතිබුණද ඉඩමක් බදු පදනමට ගැනීමට රු.3,720,000 ක්, කැණීම් කරන තිරුවානාවල බර කිරීම සඳහා පාලම් තරාදියක් සවිකිරීමට රු.2,200,000 ක්, එහි ආරක්ෂාව සඳහා රු.4,562,750 ක් ද ඇතුලුව අයභාර සහ ප්‍රාග්ධන වියදම් ලෙස සමාගම විසින් රු.20,471,481 ක් වැයකර තිබුණි. | ව්‍යාපෘති කටයුතු පවත්වාගෙන යාමට ඉඩමක් කුලී පදනම මතද මිනුම් කටයුතු සඳහා බිම් තරාදියක්ද මිලදී ගන්නා ලදි. වෙනත් ඉඩමක් සොයා ගැනීමට අපහසු බැවින් එතෙක් භාවිතා කල ඉඩම සඳහා කුලී ගෙවීමට කටයුතු කරන ලද අතර බිම් තරාදියෙහි ආරක්ෂාව සඳහා ආරක්ෂක නිලධාරීන්ගේ සේවය ලබා ගන්නා ලදි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු සලසා ඇති බැවින් දරන ලද වියදම් ආවරණය කරගනිමින් අතිරික්ත ලාභ උපයා ගැනීමට හැකියාව පවතී. | ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | 2017 හා 2019 වර්ෂ වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ ව්‍යාපෘති 2 කට අදාල බලපත්‍ර ගාස්තුවල අතිරික්තය වූ රු.854,506 ක් අයකර ගැනීමට 2020 අගෝස්තු 31 දක්වා පියවර ගෙන නොතිබුණි. | මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සිහිකැඳවීම් ලිපි යවා ඇත. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | මනම්පිටිය ව්‍යාපෘතිය සඳහා රු.2,423,224 ක් වැයකර මිලදී ගෙන තිබූ කිලෝ වොට් 40 ක විදුලිජනක යන්ත්‍රය කිසිදු ආවරණයක් නොමැතිව හා අනාරක්ෂිතව බහාලුමක වහලය මත සවිකර තිබුණි. | විදුලි ජනන යන්ත්‍රය ජලයට හා හිරු එළියට ඔරොත්තු දෙන බැවින් ආවරණ සැකසීම අවශ්‍ය නොවේ. සතුන්ගෙන් ආරක්ෂා වීමට බහලුමක් මත ස්ථාපිත කල අතර එයට බර දරා ගැනීමේ හැකියාවක් පවතී. | වත්කම්වල ආරක්ෂාව සැලසීමට කටයුතු කල යුතුය. |

## 3.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත වර්ෂයක කොන්ත්‍රාත් සේවා කාලයකට බඳවාගෙන තිබූ සේවකයින් 64 දෙනෙකුට වර්ෂ 3 කින් ගෙවීමේ පදනම මත සමාලෝචිත වර්ෂයේ | ආයතනය ආපදා ණය ලබාදීමේ හා අයකර ගැනීමේ කොන්දේසි සඳහන් කර ඇති ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත්තේ 2010 සැප්තැම්බර් මස සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි වේ. ආයතනයේ | කොන්ත්‍රාත් සේවාකාලය තුල ණය ආපසු අයකර ගැනීමට හා ණය යෝජනා ක්‍රමයක් අනුමත |

| | | |
|---|---|---|
| රු.11,566,088 ක ආපදා ණය ගෙවා තිබුණි. | සේවකයන් ස්ථිර සේවකයන් නොවන නිසා ඇපකරුවන් සඳහාද යොදා ගත යුත්තේ කොන්ත්‍රාත් පදනම මත සිටින සේවකයන්ය. | කරගැනීමට කටයුතු කල යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතියේ වැලි පැටවීම සඳහා 2009 වසරේ රු.8,883,520 ක් වැයකර කට මිලදී ගෙන තිබූ පැටවුම් යන්ත්‍රය 2016 වර්ෂයේ සිට නිශ්කාර්යව තබා තිබුණු අතර එහි එන්ජිම අලුත්වැඩියාව සඳහා 2018 වර්ෂයේ දී රු.966,595 ක් වැයකර තිබුණි. | කරුණු සමඟ ඒකඟ වේ. තක්සේරුකරුවකුගේ අගය කිරීම් යටතේ අපහරණය කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | වත්කම අපහරණයට හෝ භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමකින් තොරව පොළොන්නරුව පැවති වැඩ මුළුවකදී බෙදාහැරීම සඳහා ආයතන 2 කින් රු.972,000 කට වියලි ආහාර ද්‍රව්‍ය මිලදී ගෙන හා එක් ආයතනයකින් මිල ගණන් ලබාගෙන මනම්පිටිය ව්‍යාපෘතිය භූමියේ රු.689,030 ක් වු CCTV කැමරා 16 ක් මිලදීගෙන සවිකර තිබුණි. CCTV කැමරා පද්ධතියේ ක්‍රියාකාරීත්වය සඳහා වසරක වගකීම් කාලයක් ලබා තිබියදී ප්‍රවාහන හා නඩත්තු කටයුතු වෙනුවෙන් රු.124,500 ක් ගෙවා තිබූ අතර කැමරා 03 ක් අක්‍රීය තත්ත්වයේද ඇතැම් කැමරා නියමිත දර්ශන තලයෙන් බැහැරවද පැවතුණි | කඩිනම් අවශ්‍යතාවය නිසා සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලංකා සතොස ආයතනයෙන් මිල ගණන් කැඳවා ඊට අඩු මිල ගනන් වලට අහාර ද්‍රව්‍ය මිලදීගෙන ඇත. අවශ්‍යතාවය මත එක් ආයතනයකින් පමණක් තාක්ෂණික යෝජනාවලියක් ලබාගෙන එහි සඳහන් ආකාරයට CCTV පද්ධතිය ස්ථාපිත කර ඇත. කැමරා පද්ධතිවල දර්ශන නැවත නිවැරදි කර ඇති අතර CCTV පද්ධතියේ වගකීම් කාලයක් ලබා දී නොතිබූ කොටස් සඳහා අලුත්වැඩියා වියදම් දැරීමට සිදුවිය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) ප්‍රසම්පාදන ක්‍රමවේද නිසිපරිදි අනුගමනය නොකර මනම්පිටිය ව්‍යාපෘති භූමියේ ඉදිකර තිබූ වැසිකිලි පද්ධති 02 ක් සඳහා ඉංජිනේරුවරයෙකුගේ සහතික කිරීමකින් තොරව රු.2,524,703 ක් ගෙවා තිබුණි. | වැසිකිලි පද්ධතියේ තාක්ෂණික ප්‍රමිතීන් නිරීක්ෂණය කිරීමට පවරා තිබූ තාක්ෂණික නිළධාරියාගේ නිර්දේශ මත අදාල ගෙවීම් සිදුකර ඇත. | -එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කන්තලේ සූරියපුර ප්‍රදේශයේ මහවැලි ගඟේ ආරක්ෂණ වේලි 3 ක් ඉදිකිරීමට අදාලව වාරිමාර්ග දෙපාර්තමේන්තුව රු.148,900,000 ක් වූ ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණද එහි මුද්‍රිත සංඛ්‍යා කපා වෙනස් කර තිබීම නිසා පිළිගත නොහැකි විය. ව්‍යාපෘතිය සඳහා කියුබ් 3 කළුගල් ලොට් 60 ක් මිලදී ගැනීමට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද විශේෂ ව්‍යාපෘති කළමනාකරුට රු.මිලියන 1.7 ක අත්තිකාරමක් ගෙවා තිබූ අතර ව්‍යාපෘති කළමනාකරු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර තෝරාගත් ආයතනයකට රු.1,397,260 ක් ගෙවා කළුගල් ඝණ මීටර් 418.8 ක් යොදා වැටි දමා තිබුණි. තවද ආරක්ෂණ වේලි ඉදිකිරීමේ කාර්යය ගොවි සංවිධාන 5 ක් වෙත ගිවිසුම්වලට එළඹීමෙන් තොරව පවරා තිබූ අතර ඊට අදාලව 2020 මාර්තු 31 දිනට රු.29,642,509 ක් වාරිමාර්ග ඉංජිනේරුවරයෙකුගේ හෝ සිවිල් ඉංජිනේරු වරයෙකුගේ සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි. ඉන් රු.7,751,062 ක් වූ අතුරු ගෙවීම් 3 කදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.6 ප්‍රකාර රඳවුම් මුදල් අඩුකර ගෙනද නොතිබුණි. අදාල ඉදිකිරීම් නියමිත ප්‍රමිතියෙන් සිදුකර නොතිබූ බව වාර්මාර්ග ඉංජිනේරු (ජලශක්ති) හා ජලශක්ති අධිකාරී විසින් 2020 ජූලි 13 දින ඉදිරිපත් කල වාර්තාවක් මගින් දක්වා තිබුණි. | මුද්‍රිත සංඛ්‍යා ඇතුළත් ඇස්මේන්තුවක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. කළුගල් ලොට් 60ක් ඍජුව මිලදී ගෙන බාදන වාරකවල ඉදිකිරීම් සිදුකිරීමට ලබා දුන් තීරණ අනුව කටයුතු කර ඇත. සියළුම ඉදිකිරීම් වාරිමාර්ග දෙපාර්තමේන්තු ඉංජිනේරුවන් හා තාක්ෂණික නිලධාරීන්ට අමතරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉංජිනේරුවන් විසින් අධීක්ෂණය කළ අතර එම අධීක්ෂණ අවස්ථාවලදී කළ ලොග් සටහන් පාදක කරගනිමින් ගෙවීම් සිදු කර ඇත. ගොවි සංවිධාන සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම සම්බන්ධයෙන් වාර්තාවේ සඳහන් කරුණ හා එකඟ වේ. | -එම - |
| (ඈ) | කාර්යාල වශයෙන් භාවිතා කිරීම සඳහා බහාලුම් 7 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.1 (ඇ) ප්‍රකාරව පිරිවිතර සහ ලංසු කැඳවීමේ ලියවිලි අනුමත කර නොතිබූ අතර මාර්ගෝපදේශ අංක 6.4.1 ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීමට අදාල වාර්තාවක් තබාගෙනද නොතිබුණි. බහාලුම් 7 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර මිලදී ගැනීමෙන් අනතුරුව මාසයකට අඩු කාලයකදී නැවත බහාලුම් 03 ක් මිල සැඳහුම් ක්‍රමය යටතේ වැඩි මිලක් ගෙවා මිලදී ගෙන තිබුණි. | පුවත්පත් දැන්වීම් පළ කිරීමට පෙර තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව ලබා ගැනීම හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සිදු කර ඇත. ඉදිරියේදී ලංසු කැඳවීමේ ලේඛණ නිකුත් කිරීමට අදාළ වාර්තා තබා ගනු ලැබේ. කන්ටේනර් පෙට්ටි 07 ක් මිලදී ගනු ලැබූ අවස්ථාවේ ඒක් ලංසුවක් පමණක් ඉදිරිපත්ව තිබීම නිසා නැවත මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කරන බව සඳහන් කරමි. | -එම - |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සේවයේ නියුතු සේවකයන් 175 ක් ඇතුලුව 224 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා තිබුණ ද 2020 අගෝස්තු 31 දක්වා අනුමැතිය ලැබී නොතිබුණි. මානව සම්පත් කළමනාකරු, ප්‍රසම්පාදන හා සැපයුම් කළමනාකරු සහ අලෙවිකරණ හා සැලසුම් කළමනාකරු යන තනතුරු 3 සඳහා පුවත්පත් දැන්වීමක් මගින් ඉල්ලුම්පත් කැඳවා දැනට සිටින නිළධාරීන් තිදෙනාම බඳවාගෙන තිබුණි. අදාල බඳවාගැනීම් ක්‍රියාවලියේදී දෛනිකව ලැබුණු අයදුම්පත්‍ර නිසි පිරිදි ලේඛණගත කර නොතිබීම හා සාධාරණ නොවූ කරුණු දැක්වීම් මත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම, අනුමත නිශ්චිත පරිපාටියකින් තොරව සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු ලබා දීම හා ලකුණු ලබාදීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම යනාදිය හේතුවෙන් බඳවා ගැනීම් ක්‍රියාවලීන් සාධාරණව හා විනිවිදභාවයකින් යුතුව සිදු කර ද නොතිබුණි. | සේවක සැලැස්ම අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. පෙන්වා දී ඇති පරිදි කලමණාකරු තනතුරු සඳහා බඳවා ගැනීම් විධිමත් හා විනිවිදභාවයකින් සිදුකල යුතු බව පිලිගනිමි. | සේවක සැලැස්ම අනුමත කර ගැනීමට සහ විධිමත් පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කල යුතුයි. |